# Guideline on prevention of COVID-19 transmission through management at/ within borders

This guideline is issued for the prevention of COVID-19 transmission through the management of borders.

Different types of borders considered in the response to the COVID-19 country situation are as follows

1. **Borders created by declaration of Quarantine Curfew areas**
2. **Border created by declaration of an isolated/locked down area**
3. **Village borders in securing the village**

## 1. Border created by declaration of Quarantine Curfew areas

- The Ministry of Health has introduced the alert level system for COVID-19 country response. Refer Instruction on Alert levels in COVID-19 country response and permitted functions issued by Director General of Health Services dated 3rd November 2020.
- The Ministry of Health will from time to time announce the alert level in which the country should operate. The public activities/functions permitted, as given in the above instruction, refers to all areas of the country,
- Borders created due to locked down or isolated area is given separately below
- The permitted functions in areas declared to come under QC will be limited to those given in annexure I on **(Functions permitted in quarantine curfew-imposed areas).**

### 1.1. Border management guideline for entering / leaving Quarantine Curfew areas (in Alert Level 2 and 3)

- Quarantine Curfew is declared as a COVID-19 prevention and control measure for selected areas perceived to have high risk of transmission.
- The whole purpose of declaring Quarantine Curfew is to **restrict** movements into and within this area. People entering or leaving the QC area should understand that they are entering/leaving a high risk area and are therefore at a higher risk of exposure to COVID-19 within the area, and that they can carry the risk to other areas when leaving the QC area.
- Police barricades will control the movements into and out of QC areas so that there is **no undue travel across borders.**
- It is important for economic functions to continue as much possible, therefore **border crossing is permitted for selected economic functions**, ensuring strict adherence to health guidelines.

- Normal civil movement across borders is restricted unless it is for selected work purposes
- Refer annexure I on **Functions permitted in quarantine curfew imposed areas** - this indicates the persons who are permitted to cross boundaries, securely.
- Mobile vendors are allowed to operate only **within** the quarantine curfew area. Considering that this is a high-risk area, mobile vendors will not be permitted to enter or leave the area.

### 1.2. Guideline for restriction of people movement / crowding within the Quarantine Curfew area

Under QC, civil movement within the area is permitted only to obtain/maintain selected permitted services which are listed in the annexure I on **COVID 19 control intensified areas (quarantine curfew-imposed areas)** ensuring strict adherence to health guidelines.

The following is implemented to restrict people movement/crowding within the QC area

- Only one person per household is permitted to leave the home to obtain items from the local grocery shop or pharmacy within the QC area (within walking distance, travel from home to the shop should be by foot and not by vehicle) on a given day.
- Additionally, the NIC system will be implemented. The last digit of the NIC Number will be considered, permitting people bearing NICs with even numbers to leave home on even numbered days, and those with odd numbers to leave home on odd numbered days. If the last digit is zero this can be considered as an even number.
- Elders, pregnant mothers, and those with chronic conditions are discouraged from leaving the house in QC areas
- All groceries and pharmacies will be open daily – this is to minimize crowding and combined with recommendation 2$^{nd}$ point, allow the numbers to be controlled.

### 1.3. Exceptional circumstances

If a specific group of persons require to cross boundaries, the permission to do so will be carefully assessed by Ministry of Health, and they will be considered to do so under a bio- secure bubble and having duly submitted the assurance form. Prior information to local MOH and local police authority at destination is required.

## 2. Border created by declaration of an isolated/locked down area

The government may from time to time declare isolated (locked down) areas as a COVID-19 prevention and control measure in areas perceived to have a very high risk of transmission.

Isolated (locked down) areas differ from QC areas in that

- No civil movement is permitted out of houses in isolated (locked down) areas
- No persons are permitted to enter or leave an isolated (locked down) area other than for provision of essential services, which include provision of food/rations/essential supplies and required medicines to households by authorized officers and provision of medical services
- Essential service workers residing in isolated (locked down) areas are strongly discouraged from physically reporting to work, unless in exceptional circumstances.
- In situation that it is absolutely necessary for a person to cross borders, the reason should be clearly stated by the agency requesting permission and this should be informed to the local police authority.

## 3. Management of village borders in securing the village

- Village borders are defined as Grama Niladhari area boundaries.
- Irrespective of the COVID-19 transmission situation (at any alert level), it is important that a local mechanism is in place to secure the village, preventing COVID 19 transmission.
- Each village should take responsibility in the COVID 19 response by means of a multi stakeholder approach inclusive of local civil society organizations.
- The village securing mechanism should be implemented through the Public Administration system and is supported by several other key stakeholders of different ministries (including health) at village level and also includes civil society representation. In keeping with this structure, the COVID-19 village implementation committee is described in annexure 2

**Guidelines for the COVID-19 village implementation committee to secure the village**

The village implementation committee should act to secure their village against COVID-19:

a. Members of the committee should be fully aware of instructions/guidelines issued by Ministry of Health for different public activities/work settings for the prevention and control of COVID-19.
b. Supervise and monitor economic activities as well as public behavior at locations such as supermarkets, grocery stores, Arthika Madyasthana, fish market, religious places, etc.
c. The basic 4 practices - DReAM [physical Distancing; Respiratory etiquette; Aseptic techniques – frequent hand washing and use of hand sanitizer; avoid contact and

regularly clean frequently touched surfaces and objects; and proper use of Masks] need to be monitored.

d. Raise awareness, supervise and monitor these practices and give wide publicity to the already issued health guidelines. Currently there is poor supervision on practice of these behaviors. There is no effective outcome in installing hand wash facilities, providing hand sanitizers and marking distances for people to stand in line if practices are not done.
e. Reach out to informal sector- mobile vendors, street vendors, drivers of different categories and educate them on prevention practices
f. Ensure that all shops, groceries, drivers and traders are properly educated by sharing the relevant guidelines and asking them to submit their assurance forms.
(All concerned (organizations, shops, business etc) should resubmit the assurance form during the stipulated period)
g. Ensure that public functions (such as weddings and funerals) adhere to the instructions/guidelines issued
h. Inform the relevant authority to take action against violations of quarantine ordinance (including non-adherence to health guidelines)
i. Identify and support vulnerable groups (such as elderly, those with chronic diseases) to carry out functions in the New Normal

The COVID-19 village implementation committees will be guided, supported and supervised by the relevant Divisional Secretary (Chairperson of the COVID-19 Divisional level steering committee)

**Director General of Health Services**

**Dr. ASELA GUNAWARDENA**
Director General of Health Services
Ministry of Health
"Suwasiripaya"
385 Rev. Baddegama Wimalawansa Thero Mw,.
Colombo 10.

## Annexure I:
## Functions permitted in quarantine curfew-imposed areas

This is presented as a general guide for health, local security and local administrative bodies to have a clear understanding on what services are to operate in these areas. Persons engaged in permitted functions will require to cross boundaries and should be allowed

**The permitted functions must be carried out strictly adhering to the health guidelines already provided**

**Following functions/ organizations/ to operate:**

1. Health services
    a. Emergency services at all curative care health institutions
    b. Ambulance services
    c. Laboratory and diagnostic services
    d. Provision of OPD services by over the phone consultation with curative care institutions
    e. Private health care – General practice, medical centers & laboratory services - should follow guidelines issued by Ministry of Health & College of GPs.
    f. No routine clinics will be held, but medicines will be sent to registered clinic patients
    g. Essential home visits for maternal and child healthcare services by Public Health Midwife/ MOH team for high risk target group. Family planning services should be offered on demand
    h. Any other outbreak investigation and control measures by MOH team (includes non COVID eg. dengue , food poisoning )
    i. Pharmacy (both government and private sector)
    j. MOH offices and staff to be fully functional
    k. PDHS and RDHS office to function with the staff required as per the situation, as decided by the relevant PDHS and RDHS
2. Police stations
3. Grama Niladhari
4. All field-based officials
5. Local government authorities – with the required staff, as decided by the relevant authority
6. Utility services – electricity, water, telecommunications, Petrol stations, LP gas stations motor garages / tyre services – with the required staff to maintain services and respond to urgent breakdowns. Road maintenance / constructions to continue.
7. Agriculture – farming, livestock, fishing, without crossing district boundaries under strict precautions that can perform with distancing only

8. Grocery shops/supermarkets – should strictly display the number allowed to enter. No crowding is permitted. Only one person per household is allowed to visit the local grocery shop (within walking distance, travel from home to the shop should be by foot and not by vehicle) on a given day. Customers must wear a mask properly to cover both nose and mouth, wash hands with soap and water before entering and when leaving the shop and must minimize the time spent at the shop (30 minutes maximum). One-meter social distancing should always be maintained. Ordering online or sending the list beforehand for delivery or pick up is encouraged.
9. Mobile vendors for essential supplies (are allowed to operate only **within** the quarantine curfew area. Considering that this is a high-risk area, mobile vendors will not be permitted to enter or leave the area). No food fairs or street vendors are allowed
10. Distributors of essential supplies.
11. Bakeries – production for distribution only, which includes mobile deliveries and not bakery shops.
12. Banks – for limited financial transactions. Encourage online banking for customers.
13. Transport
    Buses to function with one passenger per seat and only for permitted activities to maintain essential services within the area to commute to service points. For emergencies Taxis/ three wheelers to be permitted under the guidelines already given with one passenger per seat. International travel – those who have already made arrangements are permitted to go to airport.
14. Funerals – to be held as soon as possible with the participation of immediate family members only. This applies only for non COVID-deaths.
15. Only one person per house will be allowed outside the house premises at a time for a specific purpose. They are advised not to spend more than three hours outside. No children accompaniment outside.
16. Pregnant women should remain at home unless for health access.
17. Other vulnerable groups (persons above 65 years / patients with chronic illnesses) are NOT permitted to move outside the house unless for medical reasons. They should obtain special passes if needed.
18. No private gatherings for any purpose of more than five persons, no religious congregations
19. Daily paid labourers (Construction sites etc) are allowed to work with specific restrictions imposed to employers on social distancing and basic hygienic measures

**All the above functions must strictly adhere to the instructions issued by health authorities for the prevention and control of COVID-19**

**All activities not identified herein are not allowed including religious gatherings, social gatherings, restaurants, hotels, guest houses, village fairs, tuition classes, sports festivals, cinemas, Spas etc**

## Annexure 2:
## COVID-19 village implementation committee

**The COVID-19 village implementation committee is made up of:**

- Grama Niladhari (GN) - Chairperson
- Public Health Inspector (PHI)
- Public Health Midwife (PHM)
- Police officer
- Agriculture research and production assistant (ARPA/ 'krupanisa')
- Samurdhi officer
- Economic development officer
- Plantation community communication facilitator (PCCF)
- Other field level officers of relevant sectors (including Social Service Officers, Probation Officers, etc)
- Religious leaders
- Community leaders
- The support of CSO should be obtained

**The functions of the COVID-19 village implementation committee include:**

- Awareness of the health instructions/guidelines through different organizations/settings
- Assist organizations in giving appropriate advice to employees and clients (as per the instructions issued by the Ministry of Health) on functioning in the 'New Normal'
- Give feedback on critical issues to the Divisional level steering committee
- Health officials to supervise and advice/issue warnings if relevant to organizations/responsible person once assurance forms are given
- Always act with the intentions of creating more public understanding and responsibility
- Involve religious leaders and other key respected community leaders in improving public understanding and responsibility
- Give feedback to the Divisional level steering committee on compliance to instructions/guidelines and use of given signages for public places and different work settings
- Meet periodically and as required by the prevailing situation in the area
- Monitor implementation using recommended indicators such as percentage of grocery shops that have submitted assurance form to MOH and local government authority; percentage compliance at randomly checked locations (fish market, village fair, religious places, grocery shops, etc) each week

## මායිම් පදනම් කරගනිමින් කොවිඩ් -19 සම්ප්‍රේෂණය වැළැක්වීම සඳහා වූ මාර්ගෝපදේශය

මායිම් කළමනාකරණය හරහා කොවිඩ් -19 සම්ප්‍රේෂණය වැළැක්වීම සඳහා මෙම මාර්ගෝපදේශය නිකුත් කරනු ලැබේ.

කොවිඩ් - 19හි රටේ පවතින තත්වයට ප්‍රතිචාර දැක්වීමේදී පහත සඳහන් පරිදි විවිධ මායිම් හඳුනාගත හැක.

1. **නිරෝධායන ඇඳිරි නීතිය ප්‍රකාශ කිරීමෙන් නිර්මාණය වූ මායිම්**
2. **හුදකලා කර ඇති ප්‍රදේශයක් ප්‍රකාශ කිරීමෙන් නිර්මාණය වූ මායිම්**
3. **රට තුල ඇති ගම් සුරක්ෂිත කිරීම සඳහා සක්‍රියව කොවිඩ් අවදානම අවම කිරීමට හඳුනාගත් ගම් මායිම්**

### 1. නිරෝධායන ඇඳිරි නීතිය ප්‍රකාශ කිරීමෙන් නිර්මාණය වූ මායිම්

- රටෙහි පවතින කොවිඩ් - 19 තත්ත්වය අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අවදානම මට්ටම් ක්‍රමයක් හඳුන්වා දී ඇත. මෙය 2020 නොවැම්බර් 3 දින අවදානම් මට්ටම් 4 කදී සිදුකලහැකි / අවසර ලත් කාර්යයන් වල ලැයිස්තුවක් ලෙස ප්‍රකාශයට පත් කොට ඇත.
- ඒ අනුව රට තුල ක්‍රියාත්මක විය යුතු අවදානම් මට්ටම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් වරින් වර ප්‍රකාශයට පත් කරනු ඇත. අදාළ කාල වකවානුව තුලදී, ප්‍රකාශයට පත්කල අවදානම් මට්ටමට අනුව අවසර දී ඇති පොදු ක්‍රියාකාරකම් / කාර්යයන් පමණක් රටේ සියලුම ප්‍රදේශ වල සිදු කල යුතු වේ.
- හුදෙකලා වූ ප්‍රදේශයක් ඇත්නම් එම ප්‍රදේශයේ කටයුතු සිදු වියුතු ආකාරය 2 කොටසින් විස්තර කෙරේ.
- එලෙසෙම නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇති ප්‍රදේශවල සිදුකිරීමට අවසරලත් කාර්යයන් ඇමුණුම 1 න් පෙන්වා දී ඇත. (ඇමුණුම 1 - නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇති ප්‍රදේශ සිදුකලහැකි කාර්යයන්).

**1.1. නිරෝධායන ඇඳිරි නීතිය ඇති ප්‍රදේශවලට ඇතුළු වීම / පිටවීම සඳහා මායිම් කළමනාකරණය සඳහා වූ මාර්ගෝපදේශය (අවදානම් මට්ටම 2 සහ 3 සඳහා මෙය අදාළ වේ)**

- නිරෝධායන ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කිරීමේ සම්පූර්ණ අරමුණ වන්නේ මෙම ප්‍රදේශය තුළට සහ ඉන් පිටතට ගමන් කිරීම සීමා කිරීමයි. ඇඳිරිනීතිය පවතින ප්‍රදේශයට ඇතුළු වන හෝ පිටවන පුද්ගලයින් තේරුම් ගත යුත්තේ ඔවුන් ඉහළ අවදානම් ප්‍රදේශයකට ඇතුළු වන විට කොවිඩ් - 19 නිරාවරණය වීමේ වැඩි අවදානමක් ඇති බවත් / පිටවන විට අවදානම වෙනත් ප්‍රදේශවලට ගෙන යා හැකි බවත්ය.
- පොලිස් මාර්ග බාධක මගින් නිරෝධායන ඇඳිරිනීති මායිම්වලදී ප්‍රදේශවලට සහ ඉන් පිටතට ගමන් කිරීම පාලනය කරනු ඇත.
- රටෙහි ආර්ථිකයට බලපෑම් කල හැකි කාර්යයන් හැකිතාක් ඉදිරියට ගෙන යාම වැදගත්ය. එබැවින් තෝරාගත් ආර්ථික කටයුතු සඳහා මායිම් හරහා ගමන් කිරීමට අවසර දී ඇති අතර සෞඛ්‍ය මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කල යුතු වේ.
- තෝරාගත් කාර්යයන් සඳහා මිස දේශසීමා හරහා සාමාන්‍ය සිවිල් සංචරණය සීමා කරනු ලැබේ.
- නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇති ප්‍රදේශ වල සිදුකලහැකි කාර්යයන් සඳහා ඇමුණුම I බලන්න

- ජංගම වෙළෙන්දන්ට ඇඳිරි නීතිය පැනවූ ප්‍රදේශය තුළ පමණක් ක්‍රියාත්මක වීමට අවසර ඇත. අවදානම් ප්‍රදේශයක වෙළදාම සිදු කරන ජංගම වෙළෙන්දන්ට එම ප්‍රදේශයට ඇතුළු වීමට හෝ පිටව යාමට අවසර නොලැබේ.

## 1.2. නිරෝධායන ඇඳිරි නීතිය යටතේ ජනතාව ගමන් කිරීම / එක්රැස්වීම සීමා කිරීම සඳහා වූ මාර්ගෝපදේශය

නිරෝධායන ඇඳිරිනීතිය යටතේ, මහජන සංචරණයට සඳහා අවසර දී ඇත්තේ ඇමුණුම I හි ලැයිස්තුගත කර ඇති තෝරාගත් අවසර ලත් සේවාවන් ලබා ගැනීමට / නඩත්තු කිරීමට පමණි.

නිරෝධායන ඇඳිරිනීතිය ඇති ප්‍රදේශය තුළ මිනිසුන් ගමන් කිරීම / තදබදය සීමා කිරීම සඳහා පහත සඳහන් දෑ ක්‍රියාත්මක කල යුතුය.

- නිරෝධායන ඇඳිරිනීතිය ඇති ප්‍රදේශය තුළ ඇති දේශීය සිල්ලර වෙළඳසැලකින් හෝ ෆාමසියකින් භාණ්ඩ ලබා ගැනීම සඳහා නිවසින් පිටවීමට අවසර ඇත්තේ එක් නිවසකට එක් පුද්ගලයෙකුට පමණි (ඇවිදින දුරින්, නිවසේ සිට සාප්පුව දක්වා ගමන් කළ යුත්තේ පයින් මිස වාහනයකින් නොවේ).
- ජාතික හැඳුනුම්පත් අංකය අනුව නිවසින් පිටවන ක්‍රමවේදය ක්‍රියාත්මක කෙරේ. හැඳුනුම්පත් අංකයේ අවසාන ඉලක්කම සලකන අතර අවසාන අංකය බින්දුව හෝ ඉරට්ටේ අංකයක් නම් ඔවුනට ඉරට්ටේ දිනයන් වල නිවසෙන් පිටවිය හැකි අතර ඔත්තේ අංක ඇති පුද්ගලයන්ට ඔත්තේ දිනයන් වල නිවසෙන් පිට විය හැක.
- වැඩිහිටියන්, ගර්භනී මව්වරුන් සහ නිදන්ගත රෝග ඇති පුද්ගලයන්ට නිරෝධායන ඇඳිරිනීතිය පනවා ඇති ප්‍රදේශවල නිවසින් පිටවීම අධෛර්යමත් කරනු ලැබේ.
- සියලුම සිල්ලර බඩු හා ෆාමසි දිනපතා විවෘතව තබන අතර, මෙය මහජනයා එක්රැස්වීම අවම කිරීම සඳහා වන අතර ඉහත 2 වන කරුණ සමඟ ඒකාබද්ධව කටයුතු කරනු ලැබේ.

## 1.3. සුවිශේෂී තත්වයන් / අවස්ථාවන්

යම් විශේෂිත පුද්ගලයින් පිරිසකට නිරෝධායනය පනවා ඇති ප්‍රදේශයක මායිමක් පසුකර යාමට අවශ්‍ය නම්, ඒ සඳහා වන අවසරය සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණයකින් පසුව ලබාදෙනු ලබන අතර, ඔවුන් එසේ කරන්නේ නම් එය ජෛව ආරක්ෂිත බුබුලක් (Bio Secure Bubble)* යටතේ සහ නිසි පරිදි එකඟතා ප්‍රකාශය ඉදිරිපත් කිරීමෙන් පසුව ලැබේ. ගමනට ප්‍රථම ගමනාන්ත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමා ද ප්‍රාදේශීය පොලිස් අධිකාරිවරයාටද තොරතුරු ලබදීම අවශ්‍ය වේ.

*{ජෛව ආරක්ෂිත බුබුල (Bio Secure Bubble) - නම් කර ඇති පුද්ගලයා හෝ කණ්ඩායම එකම හඳුනාගත් සීමාවක් තුල පමණක් සැරිසැරිය යුතු අතර ඔවුන්ගේ කර්යය ඇතුලත් නොවන අනෙකුත් පුද්ගලයන් සමඟ සෘජු සම්බන්ධතා නොපැවැත්විය යුතුය.}

## 2. හුදකලා කර ඇති ප්‍රදේශයක් ප්‍රකාශ කිරීමෙන් නිර්මාණය වූ මායිම්

රජය විසින් කොවිඩ්-19 පැතිරීම වැලැක්වීම සඳහා රට තුල වරින් වර එක් එක් ප්‍රදේශයන් හුදකලා කරනු ඇත. හුදකලා කල / lock down ප්‍රදේශ නිරෝධායන ඇදිරිනීතිය දැමූ ප්‍රදේශවලට වඩා වෙනස් වේ.

- හුදෙකලා කල ප්‍රදේශ වල / lock down නිවාස වලින් පිටත මහජන එක්රැස්වීම් සඳහා අවසර නැත.
- අත්‍යවශ්‍ය සේවාවන් සැපයීම හැර වෙනත් කිසිදු පුද්ගලයකුට හුදකලා / lock down ප්‍රදේශයකට ඇතුළු වීමට හෝ පිටව යාමට අවසර නැත. එම ප්‍රදේශවලට බලයලත් නිලධාරීන් විසින් ආහාර / සලාක / අත්‍යවශ්‍ය සැපයුම් / නිවැසියන්ට අවශ්‍ය ඖෂධ සැපයීම සහ වෛද්‍ය සේවා සැපයීම වන බවට සහතික විය යුතුය.
- අත්‍යවශ්‍ය සේවා සපයන සේවකයින් සුවිශේෂී අවස්ථාවන්හිදී හැර, හුදකලා කර ඇති / lock down ප්‍රදේශවලින් වෙනත් ප්‍රදේශයකට ගොස් සේවය කිරීමෙන් වැළකිය යුතුය.
- කිසිම පුද්ගලයෙකුට හුදකලා කර ඇති ප්‍රදේශ වලින් පිටතට යා නොහැක. පුද්ගලයෙකුට යම් සීමාවක් පසුකිරීමට අත්‍යවශ්‍ය ම වන අවස්ථාවකදී, ඒ සඳහා අවසර ඉල්ලා සිටින හේතුව පැහැදිලිව ප්‍රකාශ කළ යුතු අතර මෙය ප්‍රාදේශීය පොලිස් අධිකාරියට දැනුම් දිය යුතුය

## 3. රට තුල ඇති ගම් සුරක්ෂිත කිරීම සඳහා සක්‍රියව කොවිඩ් අවදානම අවම කිරීමට හඳුනාගත් ගම් මායිම්

- ගම් අතර ඇති ග්‍රාමීය මායිම් වලින් වෙන් වන ප්‍රදේශ ග්‍රාම නිලධාරී කොට්ඨාශ ලෙස හඳුන්වයි.
- ගම තුල කොවිඩ්-19 වසංගතය සම්ප්‍රේෂණය වැලැක්වීම සඳහා, ඕනෑම අවදානම් මට්ටමක දී ක්‍රියා කල යුතු ආකාරය පිළිබඳව යාන්ත්‍රණයක් තිබිය යුතු ය.
- සෑම ගම්මානයකම කොවිඩ්-19 පැතිරීම පිළිබඳව වගකීමෙන් කටයුතු කල යුතු අතර ඒ සඳහා හැකි සෑම පාර්ශවකරුවෙකුම හා සිවිල් සමාජ සංවිධාන සහභාගී කර ගත යුතුය.
- ගම් සුරක්ෂිත කිරීමේ යාන්ත්‍රණය රාජ්‍ය පරිපාලන පද්ධතිය හරහා ක්‍රියාත්මක කළ යුතු අතර ගම් මට්ටමින් විවිධ අමාත්‍යාංශවල (සෞඛ්‍ය ඇතුළුව) හා අනෙක් ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සහාය ලබාගත යුතු ය. මෙම ව්‍යුහයට අනුකූලව කොවිඩ්-19 වැළක්වීමේ දී ඇති කල යුතු ග්‍රාමීය කමිටු පිළිබඳව ඇමුණුම 2 හි විස්තර කර ඇත.

**ගම කොවිඩ්-19 වසංගතයෙන් ආරක්ෂා කිරීම සඳහා වූ ග්‍රාමීය කමිටු සඳහා මාර්ගෝපදේශය**

කොවිඩ්-19 න් ගම සුරක්ෂිත කිරීමට ග්‍රාමීය කමිටු ක්‍රියා කල යුතු ය:

- කොවිඩ්-19 වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා විවිධ මහජන ක්‍රියාකාරකම් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන උපදෙස් / මාර්ගෝපදේශ පිළිබඳව කමිටුවේ සාමාජිකයින් හොඳින් දැන සිටිය යුතුය.
- සුපිරි වෙළඳසැල්, සිල්ලර වෙළඳසැල්, ආර්ථික මධ්‍යස්ථාන, මත්ස්‍ය වෙළඳසැල් , ආගමික ස්ථාන ආදියෙහි සිදුවන ක්‍රියාකාරකම් හා මහජන හැසිරීම් පිළිබඳව මෙම කමිටු මගින් අධීක්ෂණය කල යුතු ය.
- කොවිඩ්-19 වැලැක්වීම සඳහා කල යුතු ප්‍රධාන පුරුදු 4 - DReAM [ශාරීරික දුරස්ථභාවය, ශ්වසන ආචාර විධි, විෂබීජ නාශක ක්‍රම - නිතර අත් සේදීම සහ අත් සනීපාරක්ෂක දියර භාවිතය, ස්පර්ශ කිරීමෙන් වැළකීම සහ නිතර ස්පර්ශ කරන ලද මතුපිට සහ වස්තූන් නිතිපතා පිරිසිදු කිරීම, මුහුණු ආවරණය නිවැරදි ලෙස භාවිතා කිරීම] නිරීක්ෂණය කළ යුතුය.

- සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ පිලිබඳව මහජනයා දැනුවත් කිරීම හා පුළුල් ප්‍රචාරයක් ලබා දීමද මෙම ක්‍රියාකාරකම් නිවැරදිව පිළිපදිනවද යන්න අධීක්ෂණය කිරීම කල යුතු ය. දැනට මහජනයා මෙම ක්‍රියාකාරකම් පිළිපැදීම දුර්වල මට්ටමක පවතින අතර මෙම ක්‍රියාකාරකම් දිරිමත් කිරීමෙන් තොරව අත් සේදීමේ පහසුකම් සැපයීම, අත් පිරිසිදුකාරකයන් සැපයීමෙන් පලක් නොවනු ඇත.
- ජංගම වෙළෙන්දන්, වීදි වෙළෙන්දන්, විවිධ කාණ්ඩවල රියදුරන් කොවිඩ්-19 වැළැක්වීමේ පිළිවෙත් පිළිබඳව දැනුවත් කිරීම කල යුතු ය.
- සියලුම භාණ්ඩ වෙළඳසැල්, සිල්ලර බඩු වෙළඳසැල් ඇතුළුව, රියදුරන් සහ වෙළෙඳුන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කල මාර්ගෝපදේශ පිලිබඳව දැනුවත් කර එකඟතා ප්‍රකාශය ඉදිරිපත් කල යුතු ය. (අදාළ සියලුම ස්ථාන - සංවිධාන, සාප්පු, ව්‍යාපාර ආදිය, ලබා දී ඇති කාල සීමාව තුළ එකඟතා ප්‍රකාශය නැවත ඉදිරිපත් කළ යුතුය.)
- මහජනයා එක්රැස් වන උත්සව (මංගල උත්සව සහ අවමංගල්‍ය වැනි) ලබා දී ඇති උපදෙස් / මාර්ගෝපදේශ වලට අනුකූලව සිදුවන බවට සහතික වන්න.
- නිරෝධායන ආඥා පනත උල්ලංඝනය කරන පුද්ගලයන්ට එරෙහිව පියවර ගැනීමට කටයුතු කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන්න. (සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාර්ගෝපදේශයන් කඩකරන පුද්ගලයන්ට එරෙහිව)
- අවදානමට ලක්විය හැකි කණ්ඩායම් (වැඩිහිටියන්, නිදන්ගත රෝග ඇති අය) හඳුනාගෙන ඔවුනට එම ක්‍රියාකාරකම් සෞඛ්‍යාරක්ෂිතව කිරීමට සහායවන්න

ප්‍රාදේශීය ලේකම්වරුන් (කොවිඩ්-19 ප්‍රාදේශීය මට්ටමේ මෙහෙයුම් කමිටුවේ සභාපති) විසින් අදාළ ග්‍රාමීය කමිටු අධීක්ෂණය කරනු ලැබේ.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ඇමුණුම I

## නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇති ප්‍රදේශවල අවසර දී ඇති කාර්යයන්

සෞඛ්‍ය, ප්‍රාදේශීය ආරක්ෂාව සපයන පොලිසිය සහ පළාත් පාලන ආයතන සඳහා මෙම ප්‍රදේශවල ක්‍රියාත්මක විය යුතු සේවාවන් මොනවාද යන්න පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම සඳහා මෙය සාමාන්‍ය මාර්ගෝපදේශය ලෙස ඉදිරිපත් කෙරේ. අවසර ලත් කාර්යයන්හි නියැලී සිටින පුද්ගලයින්ට සීමාවන් ඉක්මවා යාමට අවශ්‍ය වන අතර ඒවාට ඉඩ දිය යුතුය.

දැනටමත් සපයා ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුකූලව අවසර ලත් කාර්යයන් ඉටු කළ යුතුය.

ක්‍රියාත්මක කල හැකි කාර්යයන් / සංවිධාන:

1. සෞඛ්‍ය සේවා
    a. සියලුම සෞඛ්‍ය ආයතනවල හදිසි සේවා
    b. ගිලන්රථ සේවා
    c. රසායනාගාර සේවා
    d. දුරකථනයෙන් සාකච්ඡා කිරීමෙන් බාහිර රෝගී සත්කාරක සේවා සැපයීම
    e. පෞද්ගලික සෞඛ්‍ය සේවා - පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන සහ රසායනාගාර සේවා - සෞඛ්‍ය අමාත්‍යාංශය සහ විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය.
    f. සාමාන්‍ය සායන පැවැත්වෙන්නේ නැත. නමුත් සායනවල ලියාපදිංචි රෝගීන්ට ඖෂධ යවනු ලැබේ.
    g. අධි අවදානම් කාණ්ඩයන් සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී / සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කණ්ඩායම විසින් මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සඳහා අත්‍යවශ්‍ය ගෘහ පිවිසුම් සලසයි. ඉල්ලුම මත පවුල් සැලසුම් සේවා සැපයිය යුතුය.
    h. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කණ්ඩායම විසින් සිදුකරන වෙනත් ඕනෑම වසංගත පාලන ක්‍රියාමාර්ග (කොවිඩ් නොවන උදා: ඩෙංගු, ආහාර විෂවීම...)
    i. ෆාමසි (රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයෙන්ම)
    j. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සහ කාර්ය මණ්ඩලය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට
    k. PDHS සහ RDHS කාර්යාල, අදාළ PDHS සහ RDHS විසින් තීරණය කරන පරිදි තත්ත්වය අනුව අවශ්‍ය කාර්ය මණ්ඩලය සමඟ කටයුතු කිරීම

2. පොලිස් ස්ථාන
3. ග්‍රාම නිලධාරී
4. සියලුම ක්ෂේත්‍ර නිලධාරීන්
5. පළාත් පාලන නිලධාරීන් - අදාළ අධිකාරිය විසින් තීරණය කරනු ලබන පරිදි අවශ්‍ය කාර්ය මණ්ඩලය සමඟ
6. උපයෝගිතා සේවා - විදුලිය, ජලය, විදුලි සංදේශ, ඉන්ධන පිරවුම්හල්, එල්පී ගෑස් මධ්‍යස්ථාන මෝටර් ගරාජ / ටයර් සේවා - සේවා නඩත්තු කිරීමට සහ හදිසි බිඳවැටීම් වලට ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය සමඟ. මාර්ග නඩත්තුව / ඉදිකිරීම් දිගටම කරගෙන යාම.
7. කෘෂිකර්මාන්තය - ගොවිතැන් කිරීම, පශු සම්පත්, මසුන් ඇල්ලීම ශාරීරික දුරස්ථභාවය පවත්වා ගනිමින් දැඩි පූර්වාරක්ෂාවන් යටතේ මායිම් හරහා නොගොස් පමණක් සිදුකල යුතුය.

8. සිල්ලර වෙළඳසැල් / සුපිරි වෙළඳසැල් - ඇතුළු වීමට අවසර දී ඇති සංඛ්‍යාව අනිවාර්යෙන් ප්‍රදර්ශනය කළ යුතුය. අධික සෙනඟක් ගැවසීමට අවසර නැත. දිනකදී නිවසකින් එක් අයෙකුට

වෙළඳසැලකට යාමට අවසර ලැබේ. (ඇවිදින දුරින්, නිවසේ සිට වෙළඳසැල දක්වා ගමන් කළ යුත්තේ පයින් මිස වාහනයකින් නොවේ) . ගනුදෙනුකරුවන් නාසය සහ මුඛය ආවරණය කිරීම සඳහා මුහුණු ආවරණයක් නිසි ලෙස පැළඳිය යුතුය. ඇතුල්වීමට පෙර සහ පසු සබන් හා වතුරෙන් අත් සේදිය යුතු අතර සාප්පුවේ ගත කරන කාලය අවම කළ යුතුය (උපරිම වශයෙන් විනාඩි 30). මීටරයක ශාරීරික දුරස්ථභාවය සැමවිටම පවත්වා ගත යුතුය. අන්තර්ජාලය හරහා ඇණවුම් කිරීම හෝ වෙළඳසැලට යාමට පෙර භාණ්ඩ ලැයිස්තුව යැවීම දිරිමත් කරනු ලැබේ.

9. අත්‍යවශ්‍ය සැපයුම් සඳහා ජංගම වෙළෙන්දන්ට (නිරෝධායන ඇඳිරි නීතිය යටතේ පමණක් ක්‍රියාත්මක වීමට අවසර ඇත. මෙය අවදානම් සහිත ප්‍රදේශයක් ලෙස සලකන විට ජංගම වෙළෙන්දන්ට ප්‍රදේශයට ඇතුළුවීමට හෝ පිටව යාමට අවසර නොලැබේ). පොළවල් හෝ වීදි වෙළෙන්දන්ට අවසර නැත
10. අත්‍යවශ්‍ය සැපයුම් බෙදාහරින්නන්
11. බේකරි - බෙදා හැරීම සඳහා පමණක් නිෂ්පාදනය වන අතර එයට බේකරි සාප්පු ඇතුළත් නොවේ.
12. බැංකු - සීමිත මූල්‍ය ගනුදෙනු සඳහා, ගනුදෙනුකරුවන් සඳහා අන්තර්ජාල බැංකුකරණය දිරිමත් කරන්න.
13. ප්‍රවාහනය
    a. ප්‍රදේශය තුළ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාමට හා අවසර ලත් ක්‍රියාකාරකම් සඳහා පමණක් ආසන එකකට එක් මගියෙකු ලෙස සමඟ බස් රථ සහ සේවා ස්ථාන කරා ගමන් කිරීමට අවසර ලබා දේ. හදිසි අවස්ථා සඳහා කුලී රථ / ත්‍රිරෝද රථ සඳහා එක් ආසනයකට එක් මගියෙකු සමඟ දැනටමත් ලබා දී ඇති මාර්ගෝපදේශ යටතේ අවසර දෙනු ලැබේ.
    b. විදේශ ගමන්වාර - දැනටමත් කටයුතු සම්පාදනය කර ඇති අයට ගුවන් තොටුපළට යාමට අවසර ඇත.
    c. අවමංගල්‍ය කටයුතු - හැකි ඉක්මනින් පවුලේ සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් පැවැත්විය යුතුය. මෙය අදාළ වන්නේ කොවිඩ් නොවන මරණ සඳහා පමණි.
14. නිශ්චිත කටයුත්තක් සඳහා වරකට නිවාස පරිශ්‍රයෙන් පිටත අවසර දෙනු ලබන්නේ එක් නිවසකට එක් පුද්ගලයෙකුට පමණි. පැය තුනකට වඩා පිටත ගත නොකරන ලෙස ඔවුන්ට උපදෙස් දෙනු ලැබේ. පිටත ළමයින් යැවීමට අවසර නැත.
15. ගර්භනී කාන්තාවන් සෞඛ්‍ය අවශ්‍යතාවයක් හැර නිවසෙන් පිටත නොයා යුතුය.
16. වෙනත් අවදානම් කණ්ඩායම් (අවුරුදු 65 ට වැඩි පුද්ගලයින් / නිදන්ගත රෝග ඇති රෝගීන්) වෛද්‍ය හේතූන් මත මිස නිවසින් පිටතට යාමට අවසර නැත. අවශ්‍ය නම් ඔවුන් විශේෂ අවසර පත්‍ර ලබා ගත යුතුය.
17. පුද්ගලයින් පස් දෙනෙකුට වඩා වැඩි පිරිසකගේ පෞද්ගලික රැස්වීම්, ආගමික සභා පැවැත්වීමට අවසර නැත
18. දෛනික වැටුප් ලබන කම්කරුවන්ට (ඉදිකිරීම් ස්ථාන ආදිය) සේවායෝජකයින්ට සමාජ දුරස්ථභාවය සහ මූලික සනීපාරක්ෂක පියවරයන් සඳහා පනවා ඇති නිශ්චිත සීමාවන් සමඟ වැඩ කිරීමට අවසර ඇත

ඉහත සියළු කාර්යයන් සිදුකිරීමේදී කොවිඩ් - 19 පැතිරීම වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කරන ලද උපදෙස් දැඩි ලෙස පිළිපැදිය යුතුය.ආගමික රැස්වීම්, සමාජ රැස්වීම්, ආපනශාලා, හෝටල්, ආගන්තුක නිවාස, ප්‍රදර්ශන, උපකාරක පන්ති, ක්‍රීඩා උත්සව, සිනමා ශාලා, ස්පා වැනි මෙහි සඳහන් නොවන සියලුම ක්‍රියාකාරකම් සිදුකිරීමට අවසර නොමැත.

## ඇමුණුම II

## කොවිඩ් -19 පාලනයට ක්‍රියාත්මක වන ග්‍රාමීය මට්ටමේ ක්‍රියාකාරී කමිටුව

**කොවිඩ් -19 ග්‍රාමීය කමිටුව ඇතුලත් වන නිලධාරීන්:**

- ග්‍රාම නිලධාරී (GN)(සභාපති)
- මහජන සෞඛ්‍ය පරීක්ෂක (PHI)
- පවුල් සෞඛ්‍ය නිලධාරී(PHM)
- පොලිස් නිලධාරී
- කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර (කෘ.ප.නි.ස)
- සමෘද්ධි නිලධාරී
- ආර්ථික සංවර්ධන නිලධාරී
- වතු ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නා (පී.සී.සී.එෆ්)
- අදාළ අංශ වල වෙනත් ක්ෂේත්‍ර නිලධාරීන් (සමාජ සේවා නිලධාරීන්, පරිවාස නිලධාරීන් ඇතුළු)
- ආගමික නායකයන්
- ප්‍රජා නායකයන්
- සමාජ සංවිධාන නායකයන්

**කොවිඩ් -19 ග්‍රාමීය කමිටුව හරහා සිදුකරන කාර්යයන්:**

- විවිධ සංවිධාන/ අංශ හරහා උපදෙස් මාලාව පිළිබඳ දැනුවත්භාවය ලබාදීම
- ඔවුන්ගේ එදිනෙදා වැඩකටයුතු යථා තත්ත්වයට පත් කර ගන්නේ කෙසේ ද යන්න පිළිබඳව සුදුසු උපදෙස් (උපදෙස් මාලාව අනුව) ලබා දීම
- තීරණාත්මක කරුණු පිළිබඳව ප්‍රාදේශිය මට්ටමේ මෙහෙයුම් කමිටුවට අවශ්‍ය තොරතුරු ලබාදීම
- එකහතා ප්‍රකාශ ලබා දීමෙන් පසු, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් විසින් අවශ්‍යතාවය අනුව ආයතන අධීක්ෂණය, උපදෙස් ලබා දීම හා අනතුරු ඇඟවීම් නිකුත් කිරීම
- සෑමවිටම මහජනයා තුළ අවබෝධයක් සහ මහජනතාව වෙත වගකීමක් ඇති කිරීමේ අභිප්‍රාය මත කටයුතු කිරීම
- මහජන අවබෝධය සහ වගකීම වැඩි කිරීම සඳහා ආගමික නායකයන් සහ අනෙකුත් ගෞරවනීය ප්‍රජා නායකයන් සම්බන්ධ කර ගැනීම
- පොදු ස්ථානවල සහ විවිධ රැකියා ස්ථානවල ලබා දී ඇති සංඥා භාවිතා කිරීම පිළිබඳව උපදෙස් ලබා දීම
- මහජනතාවගේ උපදෙස් වලට අනුගත වීම පිළිබඳව ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුවට ප්‍රතිචාර ලබා දීම
- වරින් වර සහ ප්‍රදේශයේ පවතින තත්වයට අනුව කමිටුව රැස්විය යුතුය
- නිර්දේශිත දර්ශක භාවිතා කරමින් කොවිඩ් -19 පාලනය කිරීම සම්බන්ධ ක්‍රියාකාරම් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම; සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සහ පළාත් පාලන ආයතන වෙත එකහතා ප්‍රකාශ ඉදිරිපත් කර ඇති සිල්ලර වෙළඳසැල්වල ප්‍රතිශතය, අහඹු ලෙස පරීක්ෂා කරන ලද ස්ථානවල (මාළු වෙළඳපොල, ගමේ පොළ, ආගමික ස්ථාන, සිල්ලර වෙළඳසැල් ආදිය) කොවිඩ් - 19 පාලනයට අනුකූලතාවය